අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 456

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නිලධරයන්ට අදාළව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙත අවධානය යොමු කරවමින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2020.10.16 දිනැතිව අංක 18/2020 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇත. ඒ අනුව 2019.10.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 (VII) මඟින් දැනටමත් අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා රජයේ නිලධරයන්ට ලබා දී ඇති සහන කාලය 2020.10.16 දින තෙක් බලාත්මක වන බව සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා එයට සංශෝධන ලෙස මෙතෙක් නිකුත් කළ සියලු චක්‍රලේඛ මඟින් හඳුන්වා දුන් විධිවිධාන වෙනුවට 2020.10.16 දිනෙන් පසු අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අදාළ විය යුතු බවට 2020.10.05 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති බව සඳහන් කර ඇත.

02. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව උපලේඛනගත රජයේ නිලධරයන් විසින් සම්පූර්ණ කළ යුතු භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි උපලේඛනගත රජයේ සේවයේ තනතුරුවලට අදාළ මට්ටම් අනුව අදාළ කාලය තුළ සමත් විය යුතු බව අංක 2088/26 සහ 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 12.18 වගන්තියේ සඳහන් වේ.

03. ඒ අනුව 2020.10.16 දිනැති අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පදනම් කරගනිමින් 2016.11.24 දිනැතිව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යන මැයෙන් නිකුත් කර ඇති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 හි විධිවිධාන වෙනුවට 2020.10.16 දින සිට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලාත්මක විය යුතු බවට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. 2020.10.16 දිනැති අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 හි සඳහන් නියමයන් අනුව උපලේඛනගත රජයේ නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට අදාළ කාණ්ඩ වර්ගීකරණය හා ඒ ඒ කාණ්ඩයට අදාළව සම්පූර්ණ කළ යුතු පාඨමාලාවන්හි කාල සීමාව පහත පරිදි වේ.

| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 386 අනුව සේවා මට්ටම** | **අදාළ වන කාණ්ඩය** | **පාඨමාලා කාලය** |
|---|---|---|
| ප්‍රාථමික | 3 | පැය 100 |
| ද්විතියික | 2 | පැය 150 |
| තෘතියික/ ජ්‍යෙෂ්ඨ | 1 | පැය 200 |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි සඳහන් සේවා මට්ටම් වලට අනුරූපී උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ තනතුරු සහ සේවාවන් වර්ගීකරණය පහත පරිදි වේ.

I. <u>ජ්‍යෙෂ්ඨ මට්ටම</u>
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණිය
අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය - I පන්තිය
අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය - II පන්තිය

II. <u>තෘතියික මට්ටම</u>

අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණිය
අධිකරණ කළමනාකාර සහකාර සේවය - අධි ශ්‍රේණිය
අධිකරණ පවුල් උපදේශක සේවය

III. <u>ද්විතීයික මට්ටම</u>

අධිකරණ කළමනාකාර සහකාර සේවය - III, II, I ශ්‍රේණි

IV. <u>ප්‍රාථමික මට්ටම</u>

අධිකරණ පොත් බැඳුම්කරු සේවය

05. 2007.07.01 දින සිට 2020.10.16 දක්වා කාලය තුළ විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ යන ඕනෑම පදනමකින් නව තනතුරකට බඳවාගනු ලැබූ මෙතෙක් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන නොමැති සියලුම උපලේඛනගත රජයේ නිලධරයන් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව 2020.10.16 දින සිට වසර 03ක් ඇතුළත මෙම චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි අත්කර ගත යුතුය.

06. 2020.10.16 වන දින සිට විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ යන ඕනෑම පදනමකින් උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බැඳෙන සියලුම නිලධරයන් පත්වීම් දින සිට වසර 03ක් ඇතුළත තමන්ට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

07. ඉහත 05 සහ 06 වගන්ති පරිදි අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමට නියමිත කාලය අවසානයේදී භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ නොකරන නිලධරයන්ට ලබා දිය යුතු වැටුප් වර්ධකය නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන තෙක් නතර කරනු ඇත. නිලධරයෙකු රාජ්‍ය සේවයට හෝ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බැඳීමට පෙර සම්පූර්ණ කරන ලද කිසිදු භාෂා පාඨමාලාවක් මෙම චක්‍රලේඛයේ 04 ඡේදයේ සඳහන් භාෂා පාඨමාලාවන් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව සඳහා අදාළ කර ගනු නොලැබේ.

08. 2020.10.16 දිනෙන් පසු බඳවාගනු ලැබූ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සියලු තනතුරු සහ සේවාවන්ට අයත් නිලධරයන්ගේ පත්වීම් ලිපියේ සඳහන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අදාළ විධිවිධාන මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සංශෝධනය වූ ලෙස සැලකිය යුතුය.

09. 2020.10.16 දිනැති අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාව සඳහා ද අදාළ වන බව සැලකිය යුතුය.

10. මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් ඔබට අවශ්‍යවන්නේ නම්, ඒ සම්බන්ධ විමසීම් ලිඛිතව "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව" වෙත ඉදිරිපත් කළ යුතුය.

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

වර්ෂ 2022ක් වූ ඔක්තෝබර් මස 10 වන දින,
කොළඹ 12, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12